EMBASSY OF SRI LANKA
KUWAIT

# පොදු සමා කාලය - 2024

කුවේට් රජය විසින් 2024 මාර්තු මස 17වන දින සිට 2024 ජුනි මස 17වන දින දක්වා  කාලය තුළ පොදු සමා කාලයක් ප්‍රකාශයට පත්කර තිබේ. මෙම පොදු සමා කාලය තුළ වීසා නොමැතිව හෝ සේවා ස්ථානයෙන් පළා ගිය තැනැත්තන් වෙත ඔවුන්ගේ මව් රටට කිසිදු බාධාවකින් තොරව ගමන් කිරීමට හෝ නව වීසා ලබා ගනිමින් කුවේට් රාජ්‍යය තුළ සේවය කිරීමට හැකියාව ඇත. එමෙන් ම කිසියම් පුද්ගලයෙකු පොදු සමාව භාවිත කරමින් සිය මව්රටට යන්නේ නම් ඔහුට හෝ ඇයට නැවත කුවේට් රාජ්‍ය වෙත නීත්‍යානුකූලව සේවය සඳහා පැමිණීමේ හැකියාව පවතින බව කුවේට් බලධාරීන් විසින් තානාපති කාර්යාලය දැනුවත් කර ඇත. මෙම පොදු සමා කාලය භාවිත කළ හැකි වනුයේ,

A. 2024.03.14 වන දිනට පෙර සේවය කළ ස්ථානයෙන් පලා ගිය බවට (Run away) හාම්පුතා විසින් අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයට පැමිණිල්ලක් ගොනු කර ඇති තැනැත්තන්ට හෝ 2024.03.14 වන දින තෙක් වීසා නොමැතිව කුවේට් රාජ්‍යයේ රැඳී සිටි තැනැත්තන්ට පමණි.

   (මෙම චෝදනාවන්ට අමතරව අදාළ තැනැත්තාට එරෙහිව පොලිස් ස්ථානයන්හි හෝ අධිකරණයේ වෙනත් කිසිදු චෝදනාවක් හෝ පැමිණිල්ලක් නොතිබිය යුතු ය).

B. 2024.03.14 දිනට පසු සේවා ස්ථානයෙන් පලා ගිය (Run away) තැනැත්තන්ට හාම්පුතා විසින් අභ්‍යන්තර කටයුතු අමාත්‍යාංශයේ පැමිණිලි ගොනුකර ඇත්නම් ඔවුනට මෙම පොදු සමා කාලය භාවිත කරමින් ශ්‍රී ලංකාව වෙත පිටත්ව යාමට නොහැකි ය.

C. මේ වන විට ශ්‍රී ලංකාව වෙත පිටත්ව යාම සඳහා තානාපති කාර්යාලයේ ලියාපදිංචි වී ඇති තැනැත්තන් නැවත ලියාපදිංචි වීම අවශ්‍ය නොවේ. ඔවුන් වෙත තානාපති කාර්යාලය මගින් නුදුරු දිනකදී කැඳවීමක් කරනු ලැබේ. එම කැඳවීම තානාපති කාර්යාලයේ නිල මුහුණු පොතේ (Facebook) පළ කෙරෙන බැවින් ඒ පිළිබඳව විමසිලිමත් වන්න.

Sri Lanka Embassy in Kuwait

ඉහත සඳහන් A සහ B කොන්දේසි සම්පූර්ණ කරන පුද්ගලයන්ට පහත පරිදි ශ්‍රී ලංකාව වෙත පිටත්ව යාම සඳහා අවස්ථාව සලසා ගත හැකි ය.

**1. <u>වලංගු විදේශ ගමන් බලපත්‍රයක් සතු පුද්ගලයන් -</u>**

I. i. කුවේට් රාජ්‍යය වෙත පැමිණි ගමන් බලපත්‍රය භාවිත කර වීසා ලබාගෙන ඇති පුද්ගලයින්ට එම ගමන් බලපත්‍රය ම භාවිත කර ශ්‍රී ලංකාවට පිටත්ව යා හැකි ය. (ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත පැමිණීම අවශ්‍ය නොවේ).

ii කුවේට් රාජ්‍යය වෙත පැමිණි විදේශ ගමන් බලපත්‍රය හැර නව විදේශ ගමන් බලපත්‍රයක් කිසියම් තැනැත්තෙකු සතුව පවතී නම්, පහත සඳහන් ස්ථාන දෙක අතුරින් එක් ස්ථානයක් වෙත ගොස්, අදාල විදේශ ගමන් බලපත්‍රය කුවේට් රාජ්‍යයේ ආගමන හා විගමන තොරතුරු පද්ධතියට ඇතුලත් කර ගත යුතු වේ. එසේ තොරතුරු ඇතුලත් කිරිමෙන් පසුව ශ්‍රී ලංකාව වෙත ගමන් කළ හැකි වේ.

1. විදේශ ගමන් බලපත්‍ර පිළිබඳ විමර්ශන අංශය (Department of Passport Investigation Affairs) (දව්ව රදාම්), ගොඩනැගිලි අංක 03 (Building No. 03)

   එම ස්ථානය සඳහා මාර්ගගත සිතියම →

2. නේවාසික සම්බන්ධතා අංශය (Department of Residency Affairs (දජීජ් ප්‍රදේශයේ පිහිටි)

   එම ස්ථානය සඳහා මාර්ගගත සිතියම →

Sri Lanka Embassy in Kuwait

ඉහත i සහ ii අවස්ථාවන්හි දී කිසිදු දඩ මුදලක් ගුවන් තොටුපලේ දී හෝ වෙනත් ස්ථානයක දී අය කරනු නොලැබේ. එහෙත් ඔබ වෙත සේවා ස්ථානයෙන් පැන යාම හෝ වීසා කාලය ඉකුත්වීම හැර වෙනත් ආකාරයක චෝදනාවක් සම්බන්ධයෙන් පොලිස් ස්ථානයක හෝ අධිකරණයේ පැමිණිල්ලක් පවතී නම් ශ්‍රී ලංකාව බලා පිටත්ව යාමට නොහැකි වේ. එබැවින්, එබඳු ආකාරයක පැමිණිල්ලක් ඔබට පවතීදැයි තහවුරු කර ගැනීමට කටයුතු කරන්නේ නම් මැනවි. එමෙන්ම, ඔබ සතු විදේශ ගමන් බලපත්‍රයේ වලංගු කාලය ඉක්මවා ඇත්නම් තානාපති කාර්යාලය වෙත පැමිණිය යුතු වේ.

**2.** **විදේශ ගමන් බලපත්‍රයක් නොමැති පුද්ගලයන් -**

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය වෙත පහත සඳහන් දෑ සමඟ පැමිණිය යුතු වේ.

i. විදේශ ගමන් බලපත්‍රයට යොදා ගන්නා (මිලි මීටර් 45 x මිලි මීටර් 35) ප්‍රමාණයේ නිල් පැහැති පසුබිමේ ලබාගත් ඡායාරූප 04 ක්.

ii. කුවේට් රාජ්‍ය වෙත පැමිණි විදේශ ගමන් බලපත්‍රයේ පැහැදිලි ඡායා පිටපතක් හෝ කුවේට් හැඳුනුම්පත්‍රයේ (බතාකා) ඡායා පිටපතක්.

(විදේශ ගමන් බලපත්‍රයේ ඡායා පිටපතක් හෝ කුවේට් හැඳුනුම්පත්‍රයේ ඡායා පිටපතක් නොමැති පුද්ගලයන් ශ්‍රී ලංකා ජාතික හැඳුනුම්පත්‍රයේ ඡායා පිටපතක් හෝ කුවේට් රාජ්‍යය වෙත පැමිණීම සඳහා භාවිත කළ වීසා පත්‍රයේ පැහැදිලි ඡායා පිටපතක් රැගෙන ආ යුතු ය.

**3.** **කිසියම් තැනැත්තකු (කාදිම් /ශූන්) දඩමුදල් ගෙවා වීසා අලුතෙන් ලබා ගෙන නීත්‍යානුකූල තැනැත්තන් ලෙස කුවේට්හි රැඳී සිටීමට කැමති පුද්ගලයන් -**

i. ඔහු හෝ ඇය සේවය කරන ලද හාම්පුතාගෙන් (සේවා ස්ථානයෙන් පැන එන අවස්ථාවේ දී සිටි හාම්පුතා හෝ වීසා කාලය අවසන් වන අවස්ථාවේ හාම්පුතා) අවසරය (තනාසල්) ලබා ගත යුතු ය.

Sri Lanka Embassy in Kuwait

ii. කුවේට් රජය විසින් නියම කරනු ලබන දඩ මුදල ගෙවිය යුතු වේ. ( වීසා රහිතව සිටි එක් දිනකට කුවේට් ඩිනාර් දෙක බැගින් වන සේ උපරිමය කුවේට් ඩිනාර් හය සියයක මුදලක්)

iii. කිසියම් පුද්ගලයකු සේවය කරන ලද සේවා ස්ථානය මේ වන විට වසා දමා ඇත්නම්, ඒ පිළිබඳව නිත්‍යානුකූලව කටයුතු කිරීමෙන් පසු (ශූන් වෙත පැමිණිලි කිරීමෙන් පසු) මිනිස් බලය පිළිබඳ පොදු අධිකාරිය (Zoon office) ඔහුට හෝ ඇයට වෙනත් සේවා ස්ථානයක් වෙත සේවය සැපයීම සඳහා ලබා දෙනු ලබන අවසර පත්‍රය භාවිත කර වීසා අළුතින් ලබා ගත යුතු ය.

iv. ඉහත අවස්ථාවන් යටතේ වීසා අළුතින් ලබා ගැනීම සඳහා වලංගු විදේශ ගමන් බලපත්‍රය අත්‍යාවශ්‍ය වේ.

**4. <u>වලංගු විසා බලපත්‍රයක් නොමැතිව රැදී සිටින ළදරුවන් / ළමයින් ශ්‍රී ලංකාව වෙත පිටත් කර යැවීම -</u>**

පහත සඳහන් දෑ සමඟ පැමිණ ශ්‍රී ලංකා තානාපති කාර්යාලයේ ලියාපදිංචිය ලබා ගත යුතු වේ.

i. ළදරුවාගේ / ළමයාගේ උපත සහතික කිරීම සඳහා රෝහල විසින් නිකුත් කරනු ලබන රෝස පැහැති සහතිකය (Birth Notice - Pink paper)

ii. නිල් පැහැති පසුබිමේ ලබා ගත් විදේශ ගමන් බලපත්‍ර ප්‍රමාණයේ (මිලි මීටර් 45 x මිලි මීටර් 35) ඡායාරූප 02 ක්.

බලයලත් නිලධාරී

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය

කුවේට්

(යාවත්කාලීන කිරීම 2024.03.20 පෙරවරු 3.30)

Sri Lanka Embassy in Kuwait